# ළමා සංවර්ධනය පිළිබඳ ෆ්‍රොයිඩ්ගේ මතය

**නයෝමි ධනුෂිකා මුණසිංහ**

## හැඳින්වීම

ළමා මනෝවිද්‍යාව යනු මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ එන තවත් එක් වැදගත් විෂය පථයකි. සංවර්ධන මනෝවිද්‍යාව හා ළමා මනෝවිද්‍යාව බාහිරින් බැලූ විට එක හා සමාන අර්ථ ගැන්වෙන මනෝවිද්‍යාවට අදාළ ප්‍රධාන අංශ දෙකකි. මෙහි දී සංවර්ධන මනෝවිද්‍යාව යනු මිනිසකු උපන්දා සිට වයස්ගත වී මිය යන තෙක් ම ජීවිතයේ පසු කරන්නා වූ විවිධ අදියර හා එකී අදියරවල දී ත් ඇති වන කායික, මානසික, සමාජයීය සහ ප්‍රජානනික වෙනස්කම් පිළිබඳ ව අධ්‍යයනය කරන්නා වූ විෂය පථයකි. ළමා මනෝවිද්‍යාව යනු ඉන් පරිබාහිරව මිනිසෙකුගේ ළමා වියේ දී එනම් උපතේ සිට අවුරුදු දහයක් පමණ වන කාලය ළමා කාලය තුළ දී සිදුවන කායික, මානසික, සමාජයීය සහ ප්‍රජානනික වෙනස්කම් පිළිබඳ ව අධ්‍යයනය කරන්නා වූ විෂය පථයයි.

ළමා මනෝවිද්‍යාව යනු තරමක දිගු ඉතිහාසයක් සහිත ව ගොඩනැගුණු විෂය පද්ධතියකි. මනෝවිද්‍යා විෂය ආරම්භයේ පටන් ම එහි ශාඛාවක් ලෙසින් බිහි වූ, විද්‍යාත්මක අධ්‍යයන අඩංගු ළමා මනෝවිද්‍යාව අද වන විට සමාජයේ වැදගත් කතා බහට ලක්වන මාතෘකා සහිත විෂයයක් ලෙසින් හඳුන්වා දීමට හැකියාව ඇත.

ළමා මනෝවිද්‍යාව පිළිබඳ ව සැලකීමේ දී මෙහි විෂය සන්දර්භය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ඉතාමත් වැදගත් වේ. එකිනෙකට වෙනස් න්‍යාය පද්ධති අතරින් විශේෂයෙන් ම ළමා මනෝවිද්‍යාවේ විෂය අන්තර්ගතය පිළිබඳ ව සහ විද්‍යාත්මක අධ්‍යයන කරුණු ඉදිරිපත් කරන වැදගත් න්‍යායයක් ලෙස සිග්මන් ෆ්‍රොයිඩ් විසින් ඉදිරිපත් කළ මනෝවිශ්ලේෂණවාදී න්‍යායය හඳුනා ගැනීමට හැකියාවක් ඇත. තව ද මෙම මනෝවිශ්ලේෂණවාදී න්‍යායය මගින් සාම්ප්‍රදායිකව පැවත ගෙන ආ ක්‍රමවේදවලට පටහැනිව අවිඥානිකත්වය මූලික කරගත්

විශේෂ කරුණු රැසකින් ළමා මනෝවිද්‍යා ක්ෂේත්‍රය පෝෂණය කරන්නට සමත් වී තිබේ. එබැවින් විශ්ලේෂණවාදී න්‍යාය ඔස්සේ ළමා මනෝවිද්‍යාව ලෙස විස්තර කරන්නේ ද යන්න අධ්‍යයනය කිරීම වැදගත් වේ.

න්‍යායයක් යනු යම්කිසි විෂයයක් හෝ ඕනෑ ම ආකාරයක පද්ධතියක් බිහිවීමට අදාළ මූලික පදනමයි. යම්කිසි න්‍යායාත්මක පදනමක් නොමැතිව විෂයකට පැවැත්මක් නොමැත. "විද්‍යාවේදී න්‍යායයක් යනු, ස්වභාවයන් අවබෝධ කර ගැනීම සඳහා භාවිත කරනු ලබන පොදු මූලධර්මයකි." (Cherry, 2022).

ඕනෑම විෂයයකට එහි අන්තර්ගතය සකස් කිරීමට නම් න්‍යායාත්මක පසුබිමක් හෝ සහායක් අවශ්‍ය වේ. න්‍යායයකින් හුදෙක් ම එකී විෂයයට අදාළ යම්කිසි හැසිරීමක්, විස්තර කිරීමක්, පැහැදිලි කිරීමක් හෝ ඒ විෂය පද්ධතියට අදාළ කරුණු මත සිදු කෙරෙන පුරෝකථන අන්තර්ගත වන ඒකාබද්ධ ප්‍රකාශන සමූහයක් සරලව න්‍යායයක් ලෙසින් හඳුන්වා දීමට හැකියාව පවතී. මීට අමතරව න්‍යායයකින් කෙරෙන්නේ ඒ අදාළ විෂය ක්ෂේත්‍රයේ විෂය කරුණු පිළිබඳ දැක්මක් සහ අවබෝධයක් ලබා දීමයි.

සංවර්ධන මනෝ විද්‍යාවේ අන්තර්ගත වන න්‍යාය මානව වර්ධනය, සංවර්ධනය සහ ඉගෙනුම පිළිබඳ ව පුළුල් දැක්මක් ඉදිරිපත් කරයි. මෙහිදී මිනිසා උපතේ සිට වයස්ගත වීම දක්වා කාලය අතරතුර සිදුවන වෙනස්කම් සහ එකී වෙනස්කම් සඳහා බලපානු ලබන සාධක පිළිබඳ ව විද්‍යාත්මක තොරතුරු තහවුරු කිරීමක් න්‍යායයකින් සිදු කෙරේ. එමෙන්ම මෙමගින් පර්යේෂණ සොයා ගැනීම් සහ එකී සොයා ගැනීම් පිළිබඳ ව අර්ථ නිරූපණයට ද හැකියාව ලැබේ. බොහෝ විට ක්ෂේත්‍රයන්හි භාවිත කරනු ලබන න්‍යායය විද්‍යාත්මක පර්යේෂණ හරහා ගොඩනගන ලද න්‍යායයක් වීම වැදගත් වේ. එසේ විද්‍යාත්මක පදනමකින් තොරව ගොඩනැගෙන න්‍යායයක් පරීක්ෂා කිරීම තරමක් දුෂ්කර වන අතර, යම්කිසි විෂයකට අදාළ ව ගොඩනැගෙන න්‍යායයක් විද්‍යාත්මක පරීක්ෂණයක් මගින් සනාථ වීම හා ඒවා නැවත නැවත පරීක්ෂා කළ හැකි බව මූලික ව ම වැදගත් වේ.

බොහෝවිට න්‍යායයක් මගින් කෙරෙන්නේ ආවේණික විෂය ක්ෂේත්‍රයට අදාළ ව ගොඩනැගෙන ගැටලු සඳහා අදාළ පිළිතුරු නැතිනම් ප්‍රායෝගික සංකල්ප සැපයීමයි. අප විසින් අධ්‍යයනය කරන්නට යෙදෙන විෂයයේ අදාළ ගැටලු සඳහා න්‍යායාත්මක පසුබිමකින් යුතුව 'එය මෙසේ සිදුවීමට හැකියාවක් පවතී' යන විද්‍යාත්මක මූලධර්ම සැපයීම, න්‍යායයක් භාවිත කිරීමෙන් මූලික ව අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත් වැදගත් ම කරුණ වන්නේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව ගොඩ නැගෙන සියලු ම ප්‍රශ්න සඳහා න්‍යායයක් මගින් පිළිතුරු සැපයීම දුෂ්කර වන බවයි. ඇතැම් කරුණු සඳහා සැමවිටම න්‍යායයක් භාවිත කිරීමෙන් පිළිතුරු අපේක්ෂා කිරීම තරමක් දුෂ්කර කාර්යයක් වනු ඇත.

සංවර්ධන මනෝ විද්‍යාවේ දී භාවිත කරනු ලබන න්‍යාය පිළිබඳ ව සැලකීමේ දී මෙහි මූලික අපේක්ෂාව වන්නේ උපතේ සිට වයස්ගත වීම තෙක් මිනිසුන් වෙනස් වන්නේ කෙසේ ද සහ ඇයි යන්න තේරුම් ගැනීමට ඉඩකඩ සලසන මූලධර්ම සහ සාමාන්‍යකරණ පිළිබඳ ප්‍රකාශන ඉදිරිපත් කිරීමයි. මෙහිදී ජීවිත කාලය පුරා සිදුවන වෙනස්කම් පිළිබඳ ව විවිධ පුද්ගලයන් විවිධ දෘෂ්ටිකෝණවලින් කරන ලද පරීක්ෂණ හා ඒවායේ ප්‍රතිඵල ආධාරයෙන් පවතින තත්ත්ව කෙරෙහි විස්තරාත්මක විමර්ශන ඉදිරිපත් කරනු ලැබේ. මෙකී ක්ෂේත්‍රය තුළ දී මූලික වශයෙන් ම ශ්‍රේෂ්ඨ න්‍යාය, කුඩා න්‍යාය වශයෙන් ඒවායෙන් කෙරෙන අන්තර්ගතය අනුව යම් ඛණ්ඩනයක් සිදු කළ හැකි ය.

මෙම මාතෘකාවට අදාළ ව සිග්මන් ෆ්‍රොයිඩ් විසින් ඉදිරිපත් කරන ලද මනෝ විශ්ලේෂණවාදී න්‍යායය සංවර්ධන මනෝවිද්‍යාව තුළ ඉතා වැදගත් ගැටලු සහ විස්තරාත්මක පසුබිමක් සැපයීමක් සිදු කරනු ලැබේ. සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනෝවිද්‍යාව කෙරෙහි මූලික ම පදනම වී ඇත්තේ මනෝ විශ්ලේෂණවාදයයි. එනම් අවිඥානිකත්වය මූලික කර ගනිමින් ගොඩ නැගුණු මනෝ විශ්ලේෂණවාදය මනෝ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ හැරවුම් ලක්ෂයක් ලෙසින් හැඳින්වීමට හැකියාව ලැබුණි. මෙතෙක් පැවතගෙන ආ සාම්ප්‍රදායික මතවාද ඔස්සේ ගොඩනැගුණු මනෝවිද්‍යාව එකී සාම්ප්‍රදායික ආකෘතියෙන් මුදවා වෙනස් ම පැතිකඩක් ඔස්සේ බිහි කිරීමට මනෝ විශ්ලේෂණවාදය සමත් විය. එසේම මනෝවිද්‍යාව මෙතරම් ප්‍රචලිත විෂයයක් දක්වා දියුණු කරලීමට මනෝ විශ්ලේෂණවාදයට හැකියාව ලැබුණි.

මෙතරම් ජනප්‍රියත්වයක් ලැබීමට තරම් මනෝවිශ්ලේෂණවාදය සමත් වූයේ මෙහි විෂය කරුණු මූලික ව ම ගොඩනැගුණේ අවිඥානිකත්වය මත වීම වැදගත් කරුණකි. 19 වන ශත වර්ෂය අග භාගය වන විට මෙතෙක් මානසික කැළඹීම්, අස්ථාවරත්වය සඳහා ශරීරයට ප්‍රතිකාර කිරීම වෙනුවට මනස අරභයා ප්‍රතිකාර කිරීම වැදගත් යැයි වෛද්‍යවරුන් පවා සිතීමට පටන් ගත් අවධියක, නමුත් එය සිදු කිරීම ආරම්භ කරන්නේ කෙසේද යන්න පිළිබඳ ව තරමක් ගැටලුකාරී බවක් ඇති විය. එමෙන්ම මෙම කාලය වන විට ලිංගිකත්වය ද දැඩි ලෙස සමාජය තුළ කතා බහට ලක්වන මාතෘකාවක් වීම ද විශේෂත්වයක් විය. 1890 ගණන්වල මැද භාගය වන විට වික්ටෝරියානු ලිංගිකත්වය පිළිබඳ දැඩි මතවාද බිඳ වැටීම හා සමග මේ සියලු ප්‍රවේශවල ආරම්භය සිදුවිය.

මෙතෙක් සියලු කරුණු අරභයා ලිංගිකත්වය පිළිබඳ පැවැති දැඩි මතවාදය බිඳවැටී මේ සම්බන්ධයෙන් විවෘත මනසකින් බැලීමට විද්‍යාඥයින්, මනෝ වෛද්‍යවරුන් ආදී වූ සම්භාව්‍ය පිරිස නොයෙක් ප්‍රවේශ ආරම්භ කරන්නට විය. මේ සියලු කාරණා සමගම සිග්මන් ෆ්‍රොයිඩ් විසින් මෙතෙක් සාම්ප්‍රදායිකව පැවත ගෙන ආ මානසික රෝග ගවේෂණය කිරීමේ ක්‍රමවේදය වෙනස් කිරීමට මුල පුරන ලදී. මෙතෙක් බොහෝ විට මානසික රෝග සඳහා කායික ප්‍රතිකාර කිරීමේ ක්‍රමවේදය පමණක් සුලභව භාවිත වන්නට විය. ෆ්‍රොයිඩ්ගේ වෛද්‍ය සායනයට පැමිණි ඇනා නම් රෝගියාගේ සිද්ධියෙන් අනතුරුව මානසික රෝග සඳහා ශරීරයට ප්‍රතිකාර කිරීම ඵලදායී නොවන බැව් වටහාගත් අතර මෙම මානසික රෝගවලට බලපෑම් කරන්නේ බාහිරට පෙන්නුම් කරන දේ පමණක් නොව ඊට අභ්‍යන්තරිකව සිදුවන යම් ක්‍රියාවලියක් බැව් තේරුම් ගන්නා ලදී. එකී අභ්‍යන්තරික ශක්තිය අවිඥානය මත මූලිකව පදනම් වන බව මුල්වරට සොයාගනු ලැබුවේ සිග්මන් ෆ්‍රොයිඩ් විසිනි.

මෙලෙස අවිඥානය මූලික කරගෙන බිහි වූ මනෝවිද්‍යා ගුරුකුලය මනෝවිශ්ලේෂණවාදය ලෙසින් නම් කරන ලදී. මනෝවිශ්ලේෂණවාදයේ දී මනසේ ක්‍රියාකාරීත්වය සඳහා බලපෑම් කරන බලවේගය ලෙසින් අවිඥානය (Unconscious) මූලික වශයෙන් හඳුනා ගන්නා ලදී. එමෙන්ම මනස සම්බන්ධව සිදුවන

සියලුම ක්‍රියාකාරීත්වයන් පදනම් වන්නේ අවිඥානිකත්වය හා ඊට සමගාමීව ක්‍රියාත්මක වන ශක්තියෙන් හා ඒවායේ ක්‍රියාකාරීත්වයෙන් බව ෆ්‍රොයිඩ්ගේ අදහස විය. ළමා සංවර්ධනයෙහි ලා අවිඥානය හා සම්බන්ධ ව බිහිවුණු මනෝවිශ්ලේෂණවාදය බොහෝ විස්තරාත්මක පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට මූලිකත්වය සැකසුණු ශ්‍රේෂ්ඨ න්‍යායයක් ලෙසින් හැඳින්වීමට හැකියාවක් ඇත.

මනෝවිශ්ලේෂණවාදී න්‍යායයේ මූලික හරය පිළිබඳ අදහස් සම්පිණ්ඩනය කිරීමේ දී අවිඥානිකත්වය වැදගත් භූමිකාවක් ලබා දෙන අතර ම, ෆ්‍රොයිඩ් ළමා කාලයේ දී අප විසින් අත්විඳිනු ලබන අත්දැකීම්, මතක සහ මිහිරි අමිහිරි සිදුවීම් අපගේ ඉදිරි ජීවිතයේ බොහෝමයක් ක්‍රියාකාරකම් සඳහා හේතු සාධක වන බව විස්තර කථනය කරයි. ඒ අනුව යම්කිසි පුද්ගලයකු තමාගේ ළමා කාලයේ ලබා ගන්නා ලද අත්දැකීම්, මතක, මිහිරි හෝ අමිහිරි සිදුවීම් සිය අවිඥානයේ තැන්පත්ව ගබඩා කර තබා ගන්නා අතර ඉන්පසු ඒවා ඉදිරි ජීවිතයේ දී ඔහු හැසිරෙන හා ක්‍රියාකරන ආකාරය තීරණය කිරීම එමගින් සිදුවන බව තවදුරටත් පැහැදිලි කරයි. යථෝක්ත කරුණු මූලයන් මත සිග්මන් ෆ්‍රොයිඩ් විසින් ඉදිරිපත් කරන ලද මනෝ විශ්ලේෂණවාදී න්‍යායය ළමා සංවර්ධනයට අදාළ බොහොමයක් ගැටලු මෙන්ම අංශ සඳහා ද ඉතා මැනවින් වැදගත් වන න්‍යායයක් ලෙසින් හඳුන්වා දීමට පුළුවන. මක් නිසාද යත් ළමා කාලය පිළිබඳ ව එතරම්ම වැදගත් කමක් දක්වන ලද න්‍යායයක් මින් පෙරදී බිහිවී නොමැති නිසා බොහොමයක් ගැටලු මෙන්ම සුවිශේෂී අංශ සඳහා ද ඉතා මැනවින් වැදගත් වන න්‍යායයක් ලෙසින් හඳුන්වා දීමට පුළුවන.

තවදුරටත් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදී න්‍යායය පිළිබඳ තරමක් ගැඹුරින් අධ්‍යයනය කරන විට ළමා සංවර්ධනයෙහි ලා වැදගත්කම් සොයා ගැනීමට හැකියාව ලැබේ. ළමා සංවර්ධනය පිළිබඳ විස්තර කෙරෙන සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදී න්‍යායයෙහි මූලික උප න්‍යායය තුනක් හඳුනාගත හැකි ය.

I. මනස පිළිබඳ න්‍යායය (Theory of Mind)
II. පෞරුෂය පිළිබඳ න්‍යායය (Theory of Personality)
III. මනෝ ලිංගික අවධි පිළිබඳ න්‍යායය (Theory of Psychosexual Development)

මතුපිට අර්ථයෙන් බැලූ විට ඉහත කී උප න්‍යායය වෙන වෙනම එකිනෙක වෙනස් යැයි පෙනුන ද මේ පිළිබඳ ව සොයා බලන කල්හි උක්ත න්‍යාය තුනම එකිනෙක හා බැඳෙන අයුරු හඳුනා ගැනීමට හැකියාව ලැබේ. මෙම න්‍යාය තුනෙන් ම ගම්‍ය වන්නා වූ කරුණු ඇසුරින් එක් න්‍යායයකින් අනෙක් න්‍යාය පෝෂණය තකා දායක වන ආකාරය මෙහිදී ප්‍රධාන වශයෙන්ම හඳුනාගත හැකි ලක්ෂණයක් වේ. සියලුම න්‍යායයන්ගේ ප්‍රධාන භූමිකාව වන්නේ ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදය බිහිවීමට පාදක වුණු අවිඥානය හා ඒ හා සම්බන්ධව ගොඩනැගෙන ශක්තීන් වීම මෙහිදී සුවිශේෂී කාරණාවක් ලෙස හඳුනා ගැනීමට හැකියාවක් ලැබේ.

## I. මනස පිළිබඳ න්‍යායය (Theory of Mind)

ෆ්‍රොයිඩ්ට අනුව පුද්ගල මනස මූලිකව ම කොටස් තුනකට බෙදා දැක්වීමට හැකියාවක් ඇත.

i. විඥානය - Conscious

ii. උප විඥානය - Sub Conscious

iii. අවිඥානය - Unconscious

විඥානය යනු පුද්ගල මනසේ ඉහළින්ම පිහිටි ස්ථරය වේ. සරලවම කිවහොත් විඥානය යනු පුද්ගලයාගේ මනසෙහි මේ මොහොතේ ක්‍රියාත්මක වන කොටස ලෙසින් හඳුන්වා දීමට පුළුවන. මේ මොහොත වන විට අප විසින් සිදු කරනු ලබන සියලුම ක්‍රියාකාරකම්වල එකතුව විඥානය ලෙසින් පැහැදිලි කළ හැකි ය. උදාහරණයක් ලෙස මේ මොහොතේ දී ඔබ විසින් මෙම තොරතුරු කියවීම් සිදු කරනු ලබයි. එය මේ මොහොතේ කරනු ලබයි. එය ඔබගේ විඥානිකත්වය වශයෙන් හඳුන්වා දීමට හැකියාවක් ඇත.

උප විඥානය යනු පුද්ගල මනසේ පහසුවෙන් එළඹිය නොහැකි නමුත් ළඟා විය හැකි ස්ථරය ලෙස හඳුන්වා දීමට හැකියාවක් ඇත. විඥානය තරම් පහසුවෙන් ළඟා විය නොහැකි නමුත් තරමක ආයාසයකින් ළඟා විය හැකි මනසේ කොටස, උප විඥානය ලෙස

හඳුන්වා දී තිබේ. උදාහරණයක් ලෙසින් ගතහොත් ඔබගෙන් යමෙකු පසුගිය වසරේ මිලදී ගත් පාවහන් යුගලයේ වර්ණය විමසුවොත් ඔබට එකවර එයට ළඟා වීමට අපහසුය. නමුත් යම් ආයාසයක් දැරීමෙන් අනතුරුව ඔබට එම තොරතුරු කරා ළඟා වීමේ හැකියාවක් පවතී. එය උප විඥානය ලෙසින් හඳුන්වා දිය හැකි ය.

අවිඥානය යනු ඉහත කී ස්ථර දෙකට වඩා වෙනස් වූ මනසේ ප්‍රධාන ම ස්ථරයයි. අවිඥානය යන්නෙන් ෆ්‍රොයිඩ් අදහස් කරන්නේ පුද්ගල මනසේ කිසිසේත්ම එළඹිය නොහැකි ස්ථරයයි. විඥානය පුද්ගලයෙකුගේ අමිහිරි මතක අත්දැකීම්, ළමා කාලයේ සිදු වූ අප්‍රසන්න සිදුවීම්, බඩගින්න, ලිංගිකත්වය යනාදී අසීරුවෙන් හෝ ඉබේම යටපත් කරන්නට යෙදෙන්නා වූ සිතුවිලිවලින් පරිපූර්ණ වූ අංශයක්/ස්ථරයක් ලෙසින් විස්තර කොට තිබේ. මෙම අවිඥානිකත්වය ක්‍රියාත්මක වන්නේ ලිබිඩෝ (Libido) ශක්තිය මූලික කරගෙන වීම මෙහිදී වැදගත් වේ. අවිඥානය තුළ පවතින සිතුවිලිවලට ළඟා වීම පුද්ගලයකුට ඉතා අසීරු කර්තව්‍යයක් වන අතර එහි පවතින තොරතුරු බාහිරට ලබා ගැනීම ඉතාමත් දුෂ්කර කාර්යයක් ලෙස දක්වා තිබේ. කෙසේ වෙතත් මෙම අවිඥානය තුළ පවතින ඇතැම් සිදුවීම් අපට එළඹිය නොහැකි මට්ටමේ ඒවා වුවත් ෆ්‍රොයිඩ් සඳහන් කරන පරිදි යම් යම් උපක්‍රම භාවිත කිරීම මගින් අවිඥානය කරා එළැඹිය හැකි ය. ඒවා අතරින් සිහින විශ්ලේෂණය (Dream Analysis), නිදහස් සංසටනය (Free Association) හා ෆ්‍රොයිඩියානු කට වැරදීම් (Freudian Slips) යනාදිය මූලික වශයෙන්ම හඳුන්වාදිය හැකි ය. මෙවැනි උපක්‍රම භාවිත කිරීම ඔස්සේ අවිඥානයේ තැන්පත්ව පවතින යම් යම් කරුණු මතුපිට ස්තරය කරා ළඟා කරගත හැකි ය.

ෆ්‍රොයිඩ්ගේ මනස පිළිබඳ න්‍යායය ඔහු විසින් එක්තරා ප්‍රසිද්ධ උදාහරණයක් මගින් තවදුරටත් පැහැදිලි කරනු ලබයි. ඔහු පවසන ආකාරයට පුද්ගල මනස යනු නිශ්චල ජලයේ පාවෙන අයිස් කුට්ටියකට සමාන යැයි විශ්වාස කරයි. ජලයේ ඉහළට මතුවී පෙනෙන කුඩා ස්ථරය විඥානය ලෙසින් ඔහු පෙන්වා දෙයි. ජලය මතුපිට ඇති හා ජල මට්ටම හා සමානව පවතින කොටස උප විඥානය ලෙසින් විස්තර කරයි. එමෙන්ම ජලයේ ගිලී පවතින මතුපිටින් නොපෙනෙන විශාල ස්ථරය ඔහු අවිඥානය ලෙසින් හඳුන්වා දෙනු ලබයි. අයිස්

කුට්ටියක් ජලයේ පාවෙන විට එහි ගැඹුරු සහ විශාලතම කොටස ජලයේ ගිලී පවතී. එය කිසි විටෙකත් මතු පිටට නොපෙනෙන අතර එම විශාල කොටස මත මතුපිට සියලු කොටස් රඳා පවතින්නේ යම් සේද ඒ ආකාරයට ම පුද්ගල මනස ද අවිඥානික ක්‍රියාකාරීත්වයෙන් ප්‍රබලතාව මත රඳා පවතින බව පැහැදිලි කරයි. එමෙන්ම ළමා කාලයේ දී පුද්ගලයෙකු ලබන අත්දැකීම් මත අවිඥානිකත්වය ප්‍රධාන වශයෙන් ම සකස් වන බව ඔහුගේ අදහස විය.

## II. පෞරුෂත්වය පිළිබඳ න්‍යායය

මනස පිළිබඳ න්‍යායයෙන් වියුක්තව ගොඩනැගුණු පෞරුෂය පිළිබඳ ෆ්‍රොයිඩ්ගේ න්‍යායය ද ඉතාමත් වැදගත් න්‍යායයකි. එම මතවාදයට අනුව පුද්ගලයාගේ අවිඥානිකත්වයේ ක්‍රියාකාරීත්වය හා ප්‍රබලතාව මත පුද්ගල පෞරුෂය බිහිවෙයි. මෙහිදී පුද්ගලයකුගේ පෞරුෂත්වය සකස් වීමට නම් ළමා කාලයේ ලත් අත්දැකීම් බොහෝ සෙයින් ඉවහල් වන බව ෆ්‍රොයිඩ්ගේ මතවාදයේ පැහැදිලිව සඳහන් වේ. එමෙන් ම අවිඥානිකත්වයේ එන ලිබිඩෝ ක්‍රියාකාරීත්වය මත පුද්ගල පෞරුෂත්වය සකස්වීම තීරණය වේ. එහි විස්තර කරන ආකාරයට පුද්ගලයකුගේ පෞරුෂයේ ප්‍රධාන කොටස් තුනක් හඳුනා ගැනීමට හැකි ය.

i. ඉඩ් සංස්කාරය - (Id)

ii. උපරි අහංභාවය - (Super Ego)

iii. අහංභාවය - (Ego)

පුද්ගල පෞරුෂත්වය සමස්ත කොටසක් ලෙසින් සැලකීමේ දී ඕනෑම පුද්ගලයකුගේ පෞරුෂයේ මෙම කොටස් තුන දැකගත ගත හැකි ය.

ඉඩ් යනු පුද්ගල පෞරුෂයේ මූලික ම කොටස වන අතර පුද්ගලයාගේ උපතේ සිට ගොඩනැගෙන ප්‍රාථමික අංශය ලෙසින් ද හැඳින්විය හැකි ය. සහජයෙන්ම ගොඩනැගෙන අංශය ලෙසින් ද සඳහන් වන අතර එම නිසා සහජාශය ලෙස ද හඳුන්වයි. එමෙන්ම

පුද්ගල පෞරුෂයේ සත්ත්ව කොටස ලෙසින් ද මේ නිර්වචනය කළ හැකි ය. මෙහිදී සම්පූර්ණයෙන් ම පාහේ ක්‍රියාත්මක වන්නේ සුඛපරම මූලධර්මය මත වන අතර එහිදී ක්ෂණික සංතෘප්තියක් බලාපොරොත්තු වේ. එනම් ඉඩ්හි ඇතිවන ආශා එවෙලෙහි ම සංතෘප්ත කර දෙන ලෙස දැඩිව ඉල්ලා සිටින අතර වැදගත්ම දෙය වන්නේ ඉඩ් තුළ ඇතිවන ආශාවන් වන්නේ බොහෝ විට ලිංගිකත්වය, මරණය, කුසගින්න ආදි වූ සමාජය විසින් අනුමත නොකරන අන්දමේ දැඩි සහ ප්‍රබල මට්ටමේ ආශාවන් වීමයි. මේවා තැනටෝස් (Thanatos) හෙවත් මරණාශය ලෙසින් නම් කර තිබේ. මීට අමතරව ජීවිතය පවත්වා ගැනීමේ මූලික කරගත් ආශයන් ද මෙහි ක්‍රියාත්මක වන නමුත් වඩාත් ප්‍රබල වන මරණාශාවන් සංතෘප්ත වීමට අපොහොසත් වුවහොත් ඉඩ් කාංසාවට ලක්වේ. එනම් ඉඩ් ඉච්ඡාභංගත්වයට පත්වීම සිදුවේ. පුද්ගල පෞරුෂය උපතේ සිට මරණය දක්වා ක්‍රියාත්මක වන අතර බොහෝ විට ළදරු අවධියේ සියලුම ක්‍රියාකාරකම් තීරණය කිරීම ඉඩ් ක්‍රියාකාරීත්වය මත සිදුවන බව ෆ්‍රොයිඩ් විශ්වාස කරයි.

සුපර් ඊගෝ යනු පෞරුෂයේ වඩාත් සදාචාරාත්මක කොටස වශයෙන් හඳුන්වා දෙනු ලබයි. හොඳ නරක, සදාචාරය, නීතිය, විනය, ආචාරධර්ම ආදියෙන් පරිපූර්ණ කොටසක් වන අතර මෙය ගොඩනැගෙන්නේ වයස අවුරුදු පහළොවක් පමණ කාලයේ දී ය. සුපර් ඊගෝ කොටස සම්පූර්ණයෙන්ම පාහේ සදාචාරය මත ම ක්‍රියාත්මක වන අතර සමාජයට හිතකර චර්යා පමණක් පෞරුෂය තුළ ගොඩ නැංවීම සිදු කරයි. ක්‍රියාවක් මගින් ඇතිවන අහිතකර තත්ත්වයන් මෙන්ම එකී ක්‍රියාවේ සදාචාරාත්මක පැතිකඩ විග්‍රහ කිරීම ද මූලික ව ම සිදු කරයි.

ඊගෝ යනු ෆ්‍රොයිඩ්ට අනුව මැදිහත්කරුවකු එනම් පෞරුෂයේ යථාර්ථවාදී මූලධර්මයක් (Reality Principle) වශයෙන් ක්‍රියාත්මක වේ. ඉඩ් හා සුපර් ඊගෝ අතර ඇතිවන සදාචාරයට එරෙහි ආශාවන්ගේ ගැටුම් මැඩලීම සඳහා මැදිහත්කරු වශයෙන් ක්‍රියාත්මක වන්නේ ඊගෝය. ඉඩ් විසින් වහාම එය සංතෘප්ත කර දෙන ලෙස ඉල්ලා සිටින අතර එම ආශා සහ සදාචාරය පිළිබඳ සුපර් ඊගෝ දැඩි අවධානයක් යොමු කරන නිසා සට්ටනයක් නිර්මාණය වේ. ඉඩ් යනු ස්වභාවයෙන්ම තමන්ගේ ආශාවන් තෘප්ත කර දීම නොවුණහොත්

සාංකාවට ලක්වන මූලධර්මය වන අතර මෙකී පෞරුෂත්ව සට්ටනය හමුවේ යථාර්ථවාදීව ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න පැහැදිලි කරන මූලධර්මය ඊගෝ ලෙසින් හැඳින්වීමට හැකි ය.

නිදසුනක් වශයෙන් පන්තිකාමරය තුළ දී ඔබට දැඩි කුස කුසගින්නක් ඇති වුණි යැයි සිතන්න. ඔබගේ ගුරුවරයා පන්ති කාමරය තුළ උගන්වමින් සිටින අතර ඔබට කුසගින්න පාලනය කරගත නොහැකි ය. ඔබගේ බෑගයේ පාන් පෙත්තක් ද ඇති අතර ඉඩ් විසින් ඔබට පන්තියේ දී ආහාර ගන්න යැයි බල කර සිටී. මෙහිදී සුපර් ඊගෝ විසින් එය මැඩ පවත්වනු ලබන අතර පන්ති කාමරයක ගුරුවරයෙක් උගන්වමින් සිටිය දී ආහාර ගැනීම කොයිතරම් අශිෂ්ට ක්‍රියාවක් ද යන්න පිළිබඳ කරුණු දක්වයි. ඊගෝ මෙම ගැටුම නිරාකරණයට මැදිහත් වන අතර දෙපසම කරුණු සැලකිල්ලට ලක් කරමින් ගුරුවරයාගෙන් විමසා එළියට ගොස් ආහාර ලබා ගෙන බඩගින්න සංසිඳුවා ගැනීමට යෝජනා කරයි.

මෙලෙස එදිනෙදා ජීවිතය තුළ දී අප විසින් ගනු ලබන බොහෝ තීරණ සහ සිදු කරනු ලබන බොහෝ ක්‍රියා සඳහා මෙම ක්‍රියාවලිය පසුබිම් වන බව ෆ්‍රොයිඩ් සඳහන් කරයි. එමෙන්ම ඉඩ් යම් පුද්ගලයෙකුගේ ළදරු වියේ දී ප්‍රබලව ක්‍රියාත්මක වන අතර මේ හේතුව නිසා ළදරු වියේ දී පුද්ගලයෙකුගේ ඉල්ලීම් ඉක්මනින් ඉටු විය යුතු ඒවා යැයි ළදරුවන් අපේක්ෂා කරන්නේ එබැවින් බව ෆ්‍රොයිඩ් තවදුරටත් සඳහන් කරයි. යම් දෙයක් නොවීම නිසා එකී අවධිවල කෙරෙන බොහෝමයක් ක්‍රියා සහජ ආශයන් මත පදනම් වූ ඒවා වන බවත් එම ක්‍රියා තාර්කික පදනමක් මත බිහි නොවන ඒවා බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කරයි. එමෙන්ම ළමා වියේ දී හොඳ නරක පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇති නොවීමටත් ඒවා හේතු වන බවට ඔවුන් විසින් සඳහන් කරන ලදී.

ඉහත සඳහන් කරන ලද උප න්‍යායය සැලකිල්ලට ලක් කරමින් ෆ්‍රොයිඩ් විසින් යම් පුද්ගලයකුගේ සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කරනු ලබයි. මෙහි දී ඔහු සඳහන් කරන අන්දමට ඕනෑම පුද්ගලයෙකු සිය ජීවිතේ දී යම් සුවිශේෂී අවධි හරහා වර්ධනය වන බව විශ්වාස කරයි. එබැවින් සිග්මන් ෆ්‍රොයිඩ් අනුව ළමා සංවර්ධනය අඛණ්ඩ වර්ධනයක්

නොව අවධීන් ඔස්සේ සිදුවන එකක් බව සැලකේ. එමෙන්ම පෙර සඳහන් කරන ලද ආකාරයට පුද්ගලයකුගේ ජීවිතයේ ඉදිරි කාලය තීරණය වීමට ළමා කාලයේ සිදුවන සිදුවීම් බොහෝ විට බලපාන බව ෆ්‍රොයිඩ් ගේ අදහස විය. එම නිසා ළමා කාලයේ සංවර්ධනය පුද්ගලයෙකුගේ ජීවිතය සංවර්ධනය සඳහා සෘජුවම බලපෑම් කරන බව පැහැදිලි වේ. කෙසේ නමුත් මේ සියලුම සංවර්ධන අවධි තීරණය කිරීමට බලපාන ප්‍රධානම සංකල්පය වන්නේ අවිඥාණයයි. එමෙන්ම ඔහු සඳහන් කරන ආකාරයට අවිඥානික කාර්යභාරය මත ලිබිඩෝ ශක්තිය මේ අවධිවලදී ක්‍රියාත්මක වේ. නමුත් අවිඥානිකත්වය හරහා සිදුවන මෙම ලිබිඩෝ ශක්තියේ ක්‍රියාකාරීත්වය මත මෙකී අවධීන්වල සංවර්ධනය මූලිකවම සිදු වේ.

## III. මනෝලිංගික අවධි න්‍යායය (Psychosexual Stages Theory)

මෙහි සඳහන් ආකාරයට මෙම සංවර්ධන අවධි උපතේ සිට මැද ළමාවියට දක්වා කාලය අතරතුර ගමන් කරයි. එමෙන්ම පෙර කී ලිබිඩෝ ශක්තිය මෙම සුවිශේෂී අවධිවල දී ශරීරයේ විවිධ ස්ථාන සංතෘප්ත කිරීම අපේක්ෂා කරන අතර එය බාහිරට විද්‍යමාන වීම සිදුවේ. මෙම නිසා මෙම ශක්තිය සන්තෘප්ත කරලීම මගින් එකී සුවිශේෂී අවධියේ වර්ධනය සිදු වීම හෝ නොවීම වන බව ෆ්‍රොයිඩ් සඳහන් කරන අතරම මෙම අවධි මනෝලිංගික අවධි ලෙස පෙන්වා දෙනු ලබයි.

සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනෝලිංගික අවධි න්‍යායයේ අදියර ප්‍රධාන වශයෙන් කිහිපයක් හඳුනාගත හැකි ය.

i. මුඛීය අවධිය

ii. ගුද අවධිය

iii. නිලීන අවධිය

iv. ලිංගරූප අවධිය

v. වෘද්ධකාමික අවධිය

මුඛීය අවධිය - මෙය ක්‍රියාත්මක වන්නේ උපතේ සිට පළමු

අවුරුදු දෙක දක්වා කාල පරිච්ඡේදය අතරතුරයි. මෙම අවධියේ දී ලිබිඩෝ ශක්තිය ක්‍රියාත්මක වන ශරීර කොටස වන්නේ මුඛය හා ඒ අවට ප්‍රදේශයයි. උරාබීම මූලික අපේක්ෂාව වන අතර ළදරුවන් සිය අපේක්ෂා මුඛය හරහා සංතෘප්ත කර ගැනීම සිදුවේ. මවගෙන් කිරි උරා බීම, සැපීම වැනි ක්‍රියාකාරකම් ඔස්සේ මෙම අවධියේ දී සංතෘප්ත කිරීම බලාපොරොත්තු වේ. මෙම අවධිවල සුවිශේෂීතාව වන්නේ, මේ එක් එක් අවධියෙන් අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් හෝ අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩුවෙන් සංතෘප්ත වීම මත යම් යම් ගැටලුකාරී තත්ත්වයන් අනාගතයේ දී ඇතිවීමට ඉඩ ඇති බව ඔවුන් විසින් පෙන්වා දෙනු ලැබීමයි. එබැවින් මේ එක් එක් අදියර අවශ්‍ය ප්‍රමාණයට සංතෘප්ත වීම වැදගත් වේ. මෙම අවධියේ දී අවශ්‍ය ප්‍රමාණයට වඩා සංතෘප්ත වීම මත දරුවන් අනාගතයේ දී අධික ලෙස අන් අය මත යැපීම, ස්වාධීන වීමට හුරු නොවීම, යැපෙන පෞරුෂ අක්‍රමිකතාව (Dependant Perasonality Disorder) වැනි තත්ත්ව නිර්මාණය වීමට හේතු විය හැකි ය. අනික් අතට අවශ්‍ය ප්‍රමාණයට වඩා අවම ලෙස සංතෘප්ත වුවහොත් දුම්පානය, බුලත්විට සැපීම, නියපොතු සැපීම වැනි අහිතකර තත්ත්වයන් ඇතිවීමට හැකියාවක් පවතින බව ෆ්‍රොයිඩ් සඳහන් කරයි.

ගුද අවධිය - මෙම අවධිය අවුරුදු දෙකේ සිට හතර දක්වා කාලය තුළ ක්‍රියාත්මක වේ. මෙම අවධිය වන විට ලිබිඩෝ ශක්තිය ගුදය අවට ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වේ. මෙම අවධිය වන විට දරුවන් වැසිකිළි පුහුණුව වැනි විශේෂ ක්‍රියාකාරකම් සඳහා හුරු කරලීම අපේක්ෂාව වේ. මෙතෙක් දරුවන්ට තමන් මළපහ කිරීමට අවශ්‍ය වූ විට අනිච්ඡානුගව හෝ දෙමව්පියන් හරහා සිදු කරන අතර මෙම අවධියට ළඟා වන විට සිය අවශ්‍යතාව අදාළ ස්ථානයක සුදුසු ලෙස සිදු කිරීමට හුරු කරවීම සිදු වේ. අවශ්‍යතාවක් පැන නැගුණු පසු සුදුසු වේලාවක් එලඹෙන තුරු රඳවා තබා හෝ එය සුදුසු පරිදි බැහැර කිරීම මෙම අවධියේ මූලික අරමුණ වේ. දරුවන්ගේ එම ක්‍රියාකාරකම් සඳහා දෙමව්පියන්ගේ ඍජු දායකත්වය ඉතා වැදගත් වේ. මළපහ කිරීම සඳහා සුදුසු ස්ථානයක් සොයා එම කාර්යය නිසි ලෙස දරුවන් සිදු කරන්නේ ද සහ අනතුරුව පිරිසිදු වීම දරුවන් විසින් කෙලෙස ඉටු කරන්නේ ද යන්න සොයා බැලීම දෙමාපියන්ගේ වගකීම ය.

හරියාකාරයෙන් සිය වැසිකිළි පුහුණුව සිදු කරන දරුවන්ව ප්‍රශංසා කිරීමටත් එම කර්තව්‍යය නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත් වූ විට තරවටු නොකොට මගපෙන්වීමකින් යුතුව පුහුණු කිරීමටත් දෙමව්පියන්ගේ වගකීමක් බව පෙන්වා දුන්නේය. ගුද අවධියේ දී නිසි සංතෘප්තකරණය අනාගතයේ දී ස්වාධීන, නිරවුල්, මනා සංවිධානාත්මක ශක්තීන්ගෙන් හිමි පුද්ගලයෙකු නිර්මාණය කිරීමට දායක වන බව ෆ්‍රොයිඩ් විසින් පෙන්වා දෙන ලදී. එමෙන්ම මෙම අවධියේ දී අධික සංතෘප්තිය මත අධික පිරිසිදුකම, පිළිවෙළ, මෙන්ම ග්‍රස්තිය අනිවාර්ය පෞරුෂ අක්‍රමිකතාව (Obsessive Compulsive Disoredr) වැනි තත්ත්ව අනාගතයේ දී දරුවන්ට ඇතිවිය හැකි බවත් අනෙක් අතට අඩු සංතෘප්තිය මගින් අකාර්යක්ෂම සහ සංවිධානාත්මක ශක්තියක් නොමැති අපිරිසිදු පුද්ගලයෙක් බිහි වීමට හැකියාවක් ඇති බවත් විස්තර කරනු ලබයි.

නිලීන අවධිය- මෙම අවධිය අවුරුදු 3 සිට 4 දක්වා පමණ කාලය වන තෙක් ක්‍රියාත්මක වන අතර ලිබිඩෝ ශක්තිය පැහැදිලිව ක්‍රියාත්මක වන එක් ශරීර අංගයක් හඳුනාගත නොහැකි ය. මෙම අවධිය වන තෙක් ගැහැනු හා පිරිමි වශයෙන් දරුවන්ට වෙනස්කමක් දක්නට නොලැබේ. එහෙත් මේ අවධියට එළඹෙත්ම තමන්ගේ ප්‍රජනන ඉන්ද්‍රියයන්ගේ වෙනස්කම් කෙරෙහි දරුවන් සැලකිල්ලක් දක්වන්නට පටන් ගනියි. ගැහැනු හා පිරිමි දරුවන් තමන්ගේ වෙනස් ප්‍රජනන ඉන්ද්‍රියන් පිහිටන්නේ ඇයි යන කුතුහලය මූලිකවම ගොඩනගා ගනී.

ෆ්‍රොයිඩ් විස්තර කරන ආකාරයට මේ අවධියේ දී අත්විඳින තවත් වැදගත් සංසිද්ධියක් වන්නේ පිරිමි දරුවන් සිය මවටත් ගැහැනු දරුවන් සිය පියාටත් ආකර්ෂණය වීමයි. ලිංගිකත්වය මත මෙම ආකර්ෂණය සිදුවන බැව් විශ්වාස කරයි. මෙහිදී පිරිමි දරුවන් සිය මවට දැඩි ඇල්මක් ආදරයක් දක්වන අතර පිරිමි දරුවන් තමන් සිය පියාගේ වර්ගයට අයත් බව දැන තමන්ට වඩා පියා ශරීර ශක්තියෙන් වැඩි යැයි සිතා අවිඥානික සාංකාවක් ගොඩනගා ගනී. එහිදී පියා තමන්ගේ ශිශ්නය කපා දමයි යන කප්පාදු කාංසාව ගොඩනඟා ගන්නා අතර මේ නිසා තමන්ගේ මවට සමීප වීමට උත්සාහ කරයි. සමීප වීමට උත්සාහ කිරීමේ දී පියා විසින් එය වළක්වන්න අවිඥානික ඊර්ෂ්‍යාවක් ගොඩනගා ගනී. එය ඊඩිපස් සංකීර්ණය (Oedipus Complex) ලෙස හඳුන්වයි.

එලෙස ම ගැහැනු දරුවන් සිය පියාට සමීප වීමට උත්සාහ කරන අතර සමීප වීමේ දී එය වැළැක්වීමට මව විසින් උත්සාහ කරනු ලබන්නේ යැයි අවිඥානික බියක් ගොඩ නගාගෙන තම පියා පිළිබඳ අවිඥානික ආශාවක් ඇතිකර ගනී. එය ඉලෙක්ට්‍රා සංකීර්ණය (Electra Complex) ලෙස හඳුන්වනු ලබයි.

කෙසේ නමුත් පිරිමි දරුවන් මවටත් ගැහැනු දරුවන් පියාටත් දැඩි ආදරයක් දක්වන බව ෆ්‍රොයිඩ් සඳහන් කරයි. මෙකී අවධිය නිසි ලෙස සංතෘප්ත වන දරුවන්ට යහපත් දෙමව්පිය දූ දරු බැඳීමක් පවත්වා ගත හැකි අතර නිසි පරිදි සංතෘප්ති නොවුනහොත් අනාගතයේ දී දෙමව්පිය දූ දරු සබඳතාවල යම් ගැටලුකාරී තත්ත්වයක් ඇති විය හැකි බව සඳහන් කරයි.

ලිංගරූප අවධිය- මෙම අවධිය ක්‍රියාත්මක වන්නේ අවුරුදු පහේ සිට හය දක්වා පමණ කාලයේ දී ය. මෙම අවධියේ දී ලිබිඩෝ ශක්තිය ප්‍රජනන ඉන්ද්‍රිය හරහා ක්‍රියාත්මක වේ. මෙම අවධිය දරුවන් පාසල් යාම ආදී වූ සමාජය සමග ගැටෙන්නට පටන් ගන්නා කාලයයි. මෙහිදී ගැහැනු දරුවන් ගැහැනු දරුවන් සමග පිරිමි දරුවන් පිරිමි දරුවන් සමග සබඳතා පවත්වා ගැනීම සිදුවේ. මොවුන් තම සමාන ලිංගිකයන් කෙරෙහි පමණක් ආශ්‍රය කිරීම මේ අවදියේ දී මූලික වේ. යහපත් ලෙස සංතෘප්ත වුවහොත් අනාගතයේ දී යහපත් මිතුරු සබඳතා ඇති කර ගැනීමට හැකියාව ලැබේ. කෙසේ වෙතත් නිසි පරිදි මෙම අදියර සාර්ථක කරගත නොහැකි වුවහොත් මිතුරු මිතුරියන් ආශ්‍රයෙන් දුරස් වීමට සිදුවේ. සමාජයෙන් කොන් වී සිටීම ආදී තත්ත්වයන් ඇති වීම මෙම අවධියේ අවම සංතෘප්තිය වීම මගින් සිදුවේ.

වෘද්ධකාමික අවධිය - මෙම අවධිය අවුරුදු 11 සිට ඉහළට ක්‍රියාත්මක වන අතර ලිබිඩෝ ශක්තිය මූලිකවම ප්‍රජනන ඉන්ද්‍රිය හරහා ක්‍රියාත්මක වේ. මේ අවධියේ දී විරුද්ධ ලිංගිකයන් කෙරෙහි ආකර්ෂණය සිදුවන අතර බොහෝ විට මෙම ආකර්ෂණය වීම ප්‍රජනනය මූලික කරගත් ලිංගිකත්වය මත පදනම් වූ ආකර්ෂණයක් වීම විශේෂ ලක්ෂණයකි. මෙම අවධියේ නිසි සංතෘප්ත කිරීම මගින් යහපත් පවුල් සංස්ථාවක් නිර්මාණය වීම ආදී වූ අනාගත තත්ත්ව

නිර්මාණය කරන අතර අවම සංතෘප්තිය මඟින් පවුල් සංස්ථාව තුළ නොයෙකුත් ගැටලු ඇති විය හැකි ය.

## නිගමනය

ෆ්‍රොයිඩ් විසින් ඉදිරිපත් කරන ලද මෙම මනෝ ලිංගික සංවර්ධන න්‍යායය අදියර එකකට එකක් ඒකාබද්ධ නොවුන ද එක් අදියරක් හෝ අසාර්ථක වුවහොත් එය අනාගතයේ යම් ගැටලුවක් ඇති වීමට හේතු වන බව ෆ්‍රොයිඩ් විසින් සඳහන් කර තිබේ. එමෙන්ම මෙම අවධියේදී ලිබිඩෝ ශක්තිය නිසි ලෙස පාලනය කර ගැනීම ප්‍රධාන අරමුණ වන අතර එය ඒ ආකාරයෙන් ඉටු නොවුන හොත් අනාගත ජීවිතයේ ගැටුම් ඇති වන බව ඔහු විසින් තවදුරටත් පෙන්වා දෙන ලදී.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අතුකෝරාල, ඩී.ආර්. සහ අතුකෝරාල, එච්.එන්. (1996). *අධ්‍යාපන මනෝවිද්‍යාව හා ගුරුවරයා*. ශික්ෂා මන්දිර ප්‍රකාශන. පානදුර.

අතුකෝරල, ඩී.ආර්. සහ අතුකෝරල. එච්.එන්. (1999). *ළමා මනෝවිද්‍යාව සහ ළමා සංවර්ධනය* (තෙවන සංස්කරණය). පානදුරඃ ශික්ෂා මන්දිර ප්‍රකාශන.

Berk, L. E. (1998). *Development Through the Lifespan*. Needham Heights: A Vicon Company.

Cherry, K. (2022). *Freud's Psychosexual Stages of Development*; *Very Well Mind*. [Online] Available at: https://www.verywellmind.com/freuds-stages-of-psychosexual-development-2795962, Accessed 27 July 2022].

E.Berk, L., (2013). *Child Developemnt*. 9th ed. Boston: MA; Pearson

Geert, P. V., (1986). 11 *Children's Theories and Developmental Theory.* Advances in Psychology; Science Direct, Volume 36, pp. 365-403.

H.T, E., (1980). *Developemntal Psychobiology*. s.l.:s.n.

Juliana Martins de Souza, M. d. L. Ó. R. V., (2015). *Child development*: *analysis of a new concept*. National Library of Medicine, Volume 23, p. 1097–1104.

McLeod, S., (2019). F*reud's 5 stages of psychosexual developmen*t; *Simply Psychology*. [Online]Availableat:www.simplypsychology.org/psychosexual.html Accessed 18 July 2019].

Olivia N. Saracho, R. E., (2021). *Theorists and their developmental theories*. Early Child Development and Care, 191(7-8), pp. 993-1001.

Thomas, R. M., (2000). *Comparing theories of child development*. 5th ed. Wadsworth: Thomson Learning.